අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 453

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම</u>

රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2022 අනුව සහ අංක 2263/5 හා 2022.01.19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට සිදුකල සංශෝධනයන් උපලේඛනගත රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් අදාල කර ගත හැකිද යන්න පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විමසීමකට ප්‍රතිචාර වශයෙන් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වමින් එවන ලද රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක Pns/P5/08/17-Tem01 හා 2022.04.22 දිනැති ලිපිය පිළිබඳව සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ 12.25 ඡේදයේ ප්‍රතිපාදන පිළිබඳව සළකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022 අනුගමනය කරමින් උපලේඛනගත රජයේ නිලධරයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස සම්බන්ධයෙන් ඉහත අංක 02/2022 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන සහ 2022.01.19 දිනැති අංක 2263/5 හා 2022.01.19 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් විධිවිධාන පහත සඳහන් පරිදි අදාල කරගනු ලැබේ.

03. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරනු ලබන අතර 2022.01.01 දින සිට මෙම දීර්ඝ කිරීම ක්‍රියාත්මක වේ.

04. (අ) මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින (2022.05.31 දින) වන විට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගෙන ඇති සහ විශ්‍රාම යෑම සඳහා අනුමැතිය ලබා ගෙන ඇතිමුත් විශ්‍රාම ගොස් නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

I. 2022.05.31 දින දක්වා විශ්‍රාම ගැනීමේ අභිලාෂයෙන් යම්කිසි නිලධාරියෙකු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගෙන තිබේ නම් සහ ඔහු මෙම චක්‍රලේඛය ප්‍රකාරව තවදුරටත් සේවය කිරීමට අපේක්ෂා කරනු ලබයි නම්, ඔහු විසින් එසේ ලබා ගෙන ඇති විශ්‍රාම පූර්ව නිවාඩු කාලයට අදාල දින ගණන අදාල නිලධාරියා ඉදිරියේදී විශ්‍රාම ගන්නා අවස්ථාවේ ගන්නා විශ්‍රාම පූර්ව නිවාඩුවලින් අඩු කර ගැනීම සිදු කළ යුතු අතර, ඒ සඳහා මනාපය අදාල නිලධාරියා විසින් ලිඛිතව ලබාදීමෙන් අනතුරුව ඔහුගේ විශ්‍රාම ගැන්වීමේ ඉල්ලීම අවලංගු කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ස්වකීය ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

II. එසේම 2022.05.31 දින සිට ඉදිරි කාලයට විශ්‍රාම ලබා ගැනීමට අයදුම් කළ දැනටමත් විශ්‍රාම ගැන්වීම අනුමත කළ නිලධාරීන්ට ද ඔවුන්ගේ කැමැත්ත මත තවදුරටත් ඉහත වයස් සීමාව දක්වා සේවය කළ හැකිය. එවැනි අවස්ථාවලදී එම නිලධාරීන් තමා විසින් විශ්‍රාම ගන්වන ලෙස කළ ඉල්ලීම අවලංගු කරන ලෙස ලිඛිත ඉල්ලීමක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) 2022.01.01 සිට 2022.05.31 දින දක්වා අතර කාලයේදී විශ්‍රාම ගොස් තවදුරටත් සේවය කිරීමට අපේක්ෂා කරන බවට දැනටමත් ඉල්ලුම්කර තිබෙන නිලධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරනු ලැබේ.

I. නිලධාරියා විශ්‍රාම ගන්නා අවස්ථාවේදී විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගෙන ඇත්නම් එම නිවාඩු ඉදිරියේදී විශ්‍රාම ගන්නා අවස්ථාවේ ගන්නා විශ්‍රාම පූර්ව නිවාඩුවලින් අඩු කර ගැනීම සඳහා නිලධාරියා මනාපය පල කිරීමට යටත්ව වයස අවුරුදු 60 න් විශ්‍රාම ගැන්වීම අවංලගු කරමින් වයස අවුරුදු 65 දක්වා එම නිලධරියාට සේවය කිරීම සඳහා අවසර ලබාදීම සළකා බලනු ලැබේ.

II. ඉහත 04 (ආ) (I) හි පරිදි අවසර ලබාදුනහොත් නිලධාරියා වයස අවුරුදු 60 සම්පූර්ණවීම මත විශ්‍රාම ගැන්වීමේ දින සිට මෙම චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 65 දක්වා සේවය කිරීමට අවසර දෙමින් වයස අවුරුදු 60 න් විශ්‍රාම ගැන්වීම අවලංගු කරනු ලබන දින දක්වා නිලධාරියා යම් කාලයක් සේවය කර ඇත්නම් එම කාලය සඳහා වැටුප් ලබා ගැනීමට හිමිකමක් ඇති සේ සැලකීමට හා/හෝ සේවය නොකරන ලද කාලයක් ඇත්නම් එම කාලය වැටුප් රහිත නිවාඩු කාලයක් සේ සළකා ක්‍රියා කිරීමට අවසර ලබාදිය හැකිය.

05. පනස් පස් හැවිරිදි වයස පිරුණු විට හෝ ඉන් පසුව හෝ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ඕනෑම නිලධාරියෙකුට හෝ සේවකයකුට ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගැනීමට නියම කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවට පුළුවන. සියළුම උපලේඛනගත රජයේ නිලධරයන් හැට පස් වයස පිරුණ විට අනිවාර්යයෙන්ම සේවයෙන් විශ්‍රාම ගත යුතුය.

06. මෙයට පෙර විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව හැර අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම තවදුරටත් බලපවත්වනු ඇත.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 මැයි මස 31 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.